# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 12
NUMBER 04

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

AUGUST 10, 2009 අගෝස්තු මාසය (බුද්ධ වර්ෂ 2553 නිකිණි මාසය)


# දූෂණය අල්ලස නාස්තිය සහ සංවර්ධනය

♦ සංජය විමලරත්න විසිනි

අප රටේ පවතින දූෂණය, පගාව, වංචාව, නාස්තිය ආදිය සහ ඒවා තුරන් කරලීමේ ඇති අවශ්‍යතාව පිළිබඳව දැන් කාලයක සිටම කවුරුත් කතාකරති. අදහස් පළකරති. පසුගිය දශක දෙකකට අධික කාලයක් තිස්සේ හෙමින් වර්ධනය වූ මේ ව්‍යසනය අද අප රටේ ජන ජීවිතය තුළ කැපී පෙනෙන අංගයක් වී ඇත. සුප්‍රකට රහසක් වන මේවා ගැන අදහස් පළවුවද කිසිවෙක් ඒවා තුරන්කරලීමට කට යුතු කරන බවක් නම් නොපෙනේ. මේ තත්වයේ සැබෑ සුළ මුල විමසා, කළ හැකි ප්‍රතිකර්ම ගැන අදහස් කීපයක් පළකිරීම මේ ලිපියේ අරමුණ වෙයි.

## කෙටි ඉතිහාසයක්

බ්‍රිතාන්‍ය පාලනයේ අවසන් කාලයේද, නිදහස ලද අළුත ද රාජ්‍ය අංශයේ කටයුතු බොහෝ විට කාර්‍යක්‍ෂම වූ අතර දූෂණය, පගාව, වංචාව සහ නාස්තිය ගැන ඇසුණේ කලාතුරකිනි. ඒවා එකල දඬුවම් ලැබිය හැකි වරදවල් වීය. රජයේ ගොඩනැගිලි, පාරක්, බෝක්කුවක් සඳහා කොන්ත්‍රාත්තුව කට අයථා ලෙස මුදල් ලබා ගැනීම ආදිය ඉඳහිට ඇසුණද, දැන් මෙන් මහා පරිමාණයෙන් දූෂණ හෝ රජයේ මුදල් වංචා ගැන විවෘතව අසන්නට නොලැබිණ.

## 1960 දශකයේ සිදුවීම් හා දූෂණවල ආරම්භය

1960 කාලයේ සිටක්‍රමයෙන් රජයේ කටයුතු වලට දේශපාලකයින්ගේ ඇඟිලි ගැසීම් ඇතිවීම ඇරඹිණ. එයට පෙර පැවත් දරදඬු රාජ්‍ය පාලනයේ පොදුජනයාට අහිතකරවූ අසාධාරණකම් වළක්වාලීම සඳහා මන්ත්‍රී ඇමති මට්මෙන් කෙරුන මේවා වසර ගණනාවක් ගතවත්ම සිය දේශපාලන වාසිය සහ පටු බලාපොරොත්තු ඉටුකර ගැන්ම සඳහා සිදු කරන ඒවා බවට ක්‍රමයෙන් වර්ධනය විය. මුලදී ගුරු මාරුවීම්, පත්වීම්, උසස් කරලීම් ආදියෙන් ඇරඹුණ මේවා පසු කලෙකදී රාජ්‍ය ලිපිකරු සේවා, සෞඛ්‍ය ආදී අංශවලටද බෝවිණ. දේශපාලන සහ නෑදෑ හිතවත්කම් වලටද, පගාව සඳහාද මන්ත්‍රීවරුන් විසින් පවා මේවා කරන ලද බවට හොර රහසේ චෝදනා කිරීම් ඇරඹිණ. සමහර ඇමතිවරුන්ට පවා ප්‍රසිද්ධියේ චෝදනා එල්ල විණ. ගින්නක් නැතිව දුමක් නොනගී යන කියමන අනුව මේවායේ කිසියම් සත්‍යතාවක් තිබෙන්නට ඇත.

## 1980-90 දශක තුළ ශීඝ්‍ර වර්ධනයන්

1977 බලයට පැමිණි ජේ. ආර්. ජයවර්ධන ආණ්ඩුව සමයේ රටේ ඇරඹුණු විවෘත ආර්ථික ක්‍රමය සහ විවෘත වෙළඳ පොළ නිසා ඇතිවූ සීමා රහිත සුබෝපොභෝගී ජීවන රටාවන් යටතේ එතෙක් ස්ථාවරව පැවති ශ්‍රීලාංකික ජීවන රටාවන් නගරයේත්, ගම්බදවත් බිඳවැටෙන්නට පටන්ගත්තේය. ධනය සහ මුදල ප්‍රධාන තැනක්ගත් අතර රට තුළට අසීමිතව ගලා ආ සුබොපොභෝගී ද්‍රව්‍ය භුක්ති විඳීමත්, ජනතාව තුළ ඒ සඳහා ආශාව වඩ වඩා වර්ධනය වීමත් සිදුවිය. කුමන ක්‍රමයකින් හෝ මුදල් උපයා ඒවා ලබාගැන්ම ප්‍රධාන අරමුණ සහ අවශ්‍යතාව විය. (මහාචාර්‍ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා මේ ව්‍යසනය මනාව විශ්ලේෂණය කරමින් **ධර්මිෂ්ඨ සමාජය** නමැති පොත ලියූ අතර, ඒ නිසාම එදා ජේ.ආර්. රජයේ මැරවරයින් එතුමාට පහරදී බරපතළ ශාරීරික හානි සිදු කළ සැටිත් අපි හොඳින් දුටුවෙමු.)

වෙළහෙළඳාම් වල හා ව්‍යාපාරික අංශවල නියැළුණු අය එසේ මුදල් උපයමින් එම නව ජීවන රටාව භුක්තිවිඳි අතර ජීවන වියදම් මට්ටමද පොදුවේ අසීමිතව ඉහළ ගියේය. විවිධ අංශයේ රජයේ සේවකයන්, ගුරුවරුන් වැනි එතෙක් වැටුපෙන් යැපුණු අය ඉමහත් අසීරුවට පත්වූහ. එසේම රාජ්‍ය සේවයේ වැටුපෙන් මධ්‍යම පන්තික ජීවන රටාවක් ගෙන ගිය මේ අයට ඒ පැවති ජීවිතය ගෙන යැමට මාසික වේතනය කිසිසේත් ප්‍රමාණවත් නොවීය. රැකියාව සඳහා මුළු කාලයම කැපකිරීමට පුරුදුව සිටි මේ අයට අමතර ආදායම් ලැබීමේ මාර්ග නොතිබිණ. ව්‍යාපාරද කළ නොහැකිවීය. එසේ අසරණ බවට පත්වූ මොවුහු සිය රැකියාව සම්බන්ධව පැවති වරප්‍රසාද තුළින්ම අමතර ආදායම් සෙවීමෙහි නිරත වූහ. මෙලෙස රාජ්‍ය සේවය තුළ පගාව, අල්ලස්, දූෂණය හා වංචනික ක්‍රියා මගින් හැම මට්ටමකම වාගේ සේවකයන්ගේ මුදල් ඉපයීමේ ක්‍රම සහ විධි ඇරඹිණ.

ව්‍යාපාර හා පෞද්ගලික අංශයන්හි සේවය කළ අයට ආර්ථික වෙනස්වීම් සමග ආදායම් මට්ටම් ඉහළ ගිය අතර නව ජීවන රටාවට අවශ්‍ය වර්ණ ටෙලිවිෂන්, හයි පයි සෙට්, කම්පියුටර් ක්‍රීඩා ද, භාර්යාවන්ට හා දූ දරුවන්ට අවශ්‍ය නවීන ඇඳුම් පැළඳුම්, ක්‍රීඩා භාණ්ඩ ආදිය ද ලබාගත හැකි වීය. මේවා දකින විටද, අසන විටද වෙළඳ ප්‍රචාර මාධ්‍යයට ගොදුරුවූ රජයේ සේවකයන්ටද සමාජ මට්ටම පවත්වා ගැනීමට තරඟකිරීමට අවශ්‍ය මුදල් සපයාගැනීම අත්‍යාවශ්‍ය වීය. රාජ්‍ය සේවයේ එක තැන පල්වූ වැටුප් ක්‍රම කෙසේවත්

4 වෙනි පිටුව බලන්න →



August pageant in Kandy - Sri Lanka - better known as Kandy Perehera
*Painting by* Thalangama Jayasinghe චිත්‍රය - තලංගම ජයසිංහ

නොහිමි බැතින් පුද ලබනා දා කරඬුව උසුලා
සි යු මි ගමන් විලාසයෙන් ඇත්රජ යන ලකලා
ත න මි තනම් පදට දෑත පා නූපුර සලලා
උ තු මි ඇසළ පෙරහැර යන අසිරි කුමට නොබලා

**Bearing the sacred casket of relics, venerated by the masses**
**The ornate tusker elegantly ambles in most dignified manner**
**Dancers swing in rhythm, their anklets clinked and hissed**
**The noblest pageant of Kandy, a rare treat not to be missed**

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*

ලංකාවිත්ති වෙබ් අඩවිය Lanka Viththi Website
http://www.lankaheritage.com/lankaviththi/




ඔබේ මුදල් අදම යවන්න
අදම ලබාගන්න




විස්තර පිටු අංක 3